අභියාචනා යොමු කිරීමේ දී අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු,

1. 2024 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට සිසුන් යොමු කිරීමේ දී මූලික වටයෙන් තේරී පත් වුණු සිසුන් පාසලට ඇතුළත් කිරීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා සිසුන් යොමු කිරීමට අභියාචනා කැඳවීම ක්‍රියාත්මක වේ. අභියාචනා ඉල්ලුම්පත් යොමු කිරීමේ දී සිසුවා ලබා ඇති ලකුණු සහ පාසලට තීරණය වී ඇති කඩඉම් ලකුණු පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

2. මෙම අභියාචනා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම මාර්ගගත ව සිදු කළ යුතු අතර තැපැල් මගින් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමට හැකියාවක් නොමැති බව කාරුණික ව සලකන්න.

3. අභියාචනා කැඳවීම අදියර කිහිපයකින් සිදු වේ. එක් අදියරක දී <u>පාසලක් නොලැබුණහොත්</u> ඊළඟ අදියර සඳහා නැවත මාර්ගගත ව අභියාචනා ඉදිරිපත් කළ යුතු වේ.

4. එක් අභියාචනා අදියරක දී පාසල් 03ක් සඳහා ඉල්ලුම් කළ හැකි ය. පාසල් ලබා දීමේ දී ඉල්ලුම් කර ඇති පාසල්වලට තීරණය වී ඇති කඩඉම් ලකුණු අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ.

5. අභියාචනා මත පාසල්වලට සිසුන් තෝරා ගැනීම මාර්ගගත වැඩසටහන මගින් පමණක් සිදු කෙරෙන බැවින් අභියාචනා මාර්ගගත ක්‍රමයට යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.